# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1978 අංක 13 දරන සූතිකාධාර (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1978 දෙසැම්බර් මස 5 වන දින]

---

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1978 දෙසැම්බර් මස 29 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිල : ශත 30යි                    තැපැල් ගාස්තුව : ශත 25යි

# 1978 අංක 13 දරන සූතිකාධාර (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1978 දෙසැම්බර් මස 5 වන දින]

එල්.ඩී.—ඕ. 49/77.

**සූතිකාධාර ආඥාපනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 1978 අංක 13 දරන සූතිකාධාර (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. *ලුහුඬු නාමය.*

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) සූතිකාධාර ආඥාපනතේ 4 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ. *140 වන අධිකාරයේ 4 වන වගන්තිය ඉවත් කිරීම.*

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:— *ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.*

" සූතිකාධාර ගෙවීමට ඇති බැඳීම වත්කම් මත පළමු වැයබරක් විය යුතු බව.

12. සේවායෝජකයකු විසින් යම් කර්මාන්තයක සේවයෙහි නියුක්ත කරනු ලැබූ ගැහැණු කම්කරුව කුට සූතිකාධාර වශයෙන් යම් මුදලක් ගෙවීමට සේවායෝජකයකුගේ ඇති බැඳීම ඒ කර්මාන්තයේ වත්කම් මත පළමු වැයබරක් විය යුතු ය.".

**4.** (1962 අංක 24 දරන පනතින් ඇතුළත් කරන ලද) ප්‍රධාන ප්‍රඥප්තියේ 12අ වන වගන්තියේ (1) සහ (2) වන උපවගන්ති ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— *ප්‍රධාන ප්‍රඥප්තියේ 12 අ වන වගන්තිය සංශෝධනය කිරීම.*

"(1) යම් කර්මාන්තයක ගැහැණු කම්කරුවන් නියමිත සංඛ්‍යාවකට වැඩි සංඛ්‍යාවක් සේවයෙහි නියුක්ත කරන සේවායෝජකයකු විසින් වයස අවුරුදු පහට අඩු දරුවන් සඳහා දරකාගාරයක් ඒ වෙනුවෙන් සාදන ලද නියෝග අනුව, පිහිටුවා පවත්වා ගෙන යා යුතු අතර, වයස අවුරුදු පහට අඩු දරුවකු හෝ දරුවන් තම භාරයේ ඇති එවැනි යම් කම්කරුවකුට ඇගේ සේවායෝජක සඳහා වැඩ කිරීමට ඇයට නියම කරනු ලැබූ වේලාවන් තුළ ඒ දරුවා හෝ දරුවන් ඒ දාරකාගාරයේ තබා යාමට ඉඩ දිය යුතු ය.

(2) යම් කර්මාන්තයක හෝ යම් කර්මාන්තයක ශාඛාවක සේවයෙහි නියුක්ත කරනු ලැබූ ගැහැණු කම්කරුවන් සංඛ්‍යාව සහ ඒ කර්මාන්තයෙහි හෝ ඒ ශාඛාවෙහි ගැහැණු කම්කරුවකුට ඉටු කිරීමට නියම කරනු ලබන වැඩවල ස්වභාවය කෙරෙහි සැලකිල්ල ඇතිව කර්මාන්තයක් හෝ කර්මාන්තයේ ශාඛාවක් සඳහා සංඛ්‍යාවක් මේ වගන්තියේ කාර්යයන් සඳහා අමාත්‍යවරයා විසින් නියම කළ හැකි ය"

ඒ—37292—14,025 (78/12)

ගැහැණු කම්කරුවන් සේවයෙහි නියුක්ත කරනු ලබන සේවායෝජකයකු යයි හෝ එහි සේවයෙහි නියුක්ත කම්කරුවකු යයි විශ්වාස කිරීමට තමාට සාධාරණ හේතු ඇති යම් තැනැත්තකුගෙන් ප්‍රශ්න කිරීමට

බලය තිබිය යුතු ය.

(1අ) යම් තැනක හෝ ස්ථානයක පරීක්ෂණයක් පවත්වන අතරතුර, මේ ආඥාපනතේ විධිවිධාන පිළිපදිනු ලැබුවේ දැයි නිශ්චය කිරීමේ කාර්ය සඳහා ඒ තැන හෝ ඒ ස්ථානයේ කරගෙන යනු ලබන යම් කර්මාන්තයක ගැහැණු කම්කරුවන් සේවයෙහි නියුක්ත කරනු ලබන සේවායෝජකගෙන් විමසීම් කිරීමේ දී කොමසාරිස්වරයා හෝ විශේෂ නිලධරයකු විසින් නියම කරන ලද තොරතුරු සැපයීම ඒ සේවායෝජකගේ යුතුකම විය යුතු ය.".

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තියේ (2) වන උප වගන්තියේ (ඇ) ඡේදය වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ඇ) යම් කර්මාන්තයක ගැහැණු කම්කරුවන් සේවයෙහි නියුක්ත කරනු ලබන ස්ථාන හෝ තැන් පරීක්ෂා කිරීම ;".

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"වරද කරනු ලැබූ දින සිට අවුරුදු හයක් ඇතුළත නඩු පවරනු ලැබිය යුතු බව.

18. වරද කරනු ලැබුවේ යම් දිනයක ද ඒ දිනයේ සිට අවුරුදු හයක් ඇතුළත ඒ සම්බන්ධයෙන් පැමිණිලි කරනු ලැබුවේ නම් මිස, මේ ආඥාපනත යටතේ හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ යම් වරදක් කිසිම අධිකරණයක් විසින් සංජානනය කිරීම හෝ එවැනි වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු වරදකරු කරනු ලැබීම හෝ නො කළ යුතු ය. ඉහත කී අවුරුදු හයක කාලය ආගණනය කිරීමේ දී කොමසාරිස්වරයාගේ පූර්වානුමතිය ලබා ගැනීමේ කාර්ය සඳහා ගන්නා ලද කාලයක් ඇතොත්, එය අත් හරිනු ලැබිය යුතු ය.".

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) "සේවායෝජක" යන්නේ අර්ථකථනය වෙනුවට පහත දැක්වෙන අලුත් අර්ථකථනය ආදේශ කිරීමෙන් :—

'"සේවායෝජක" යන්නෙන් යම් ගැහැණු කම්කරුවකු තමා වෙනුවෙන් සේවයෙහි නියුක්ත කරනු ලබන යම් තැනැත්තකු හෝ ඒ තැනැත්තා

වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු විසින් සේව යෙහි නියුක්ත කරනු ලබන්නේ ද ඒ තැනැත්තා හෝ අදහස් වන අතර යම් වෙනත් තැනැත්තකු වෙනුවෙන් යම් තැනැත්තකු විසින් ගැහැණු කම් කරුවකු සේවයෙහි නියුක්ත කරනු ලබන්නේ ද ඒ තැනැත්තා ද ඇතුළත් වේ.';

(ආ) "සේවා නියුක්තිය" යන්නෙහි අර්ථකථනය වෙනුවට පහත දැක්වෙන අලුත් අර්ථකථනය ආදේශ කිරීමෙන් :—

'"සේවා නියුක්තිය" යන්නෙහි ව්‍යාකරණානුකූල වෙනස්වීම් සහ සජාතීය යෙදුම් සමග ගැහැණියක් හෝ ගැහැණු කම්කරුවකු සම්බන්ධයෙන් පාවිච්චි කරනු ලැබූ විට යම් කර්මාන්තයක සේවා නියුක්තිය අදහස් වේ.';

(ඇ) "සේවා නියුක්තිය" යන්නෙහි අර්ථකථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

'"කාර්යාලය" යන්නට සාප්පු සහ කාර්යාල සේවක යන් පිළිබඳ (සේවා නියුක්තිය සහ පාරිශ්‍රමික විධිමත් කිරීමේ) පනතේ දී ඇති අර්ථය ම ඇත්තේ ය.';

(ඈ) පිළිවෙළින් "වත්ත", "කර්මාන්ත ශාලාව", "පතල" සහ "නියමිත ආයතනය" යන්නට දී ඇති අර්ථකථන අත් හැරීමෙන් ;

(ඉ) "නියෝගය" යන්නෙහි අර්ථකථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

'"සාප්පුව" යන්නෙහි සාප්පු සහ කාර්යාල සේවක (සේවා නියුක්තිය සහ පාරිශ්‍රමික විධිමත් කිරීමේ) පනතේ එයට දී ඇති අර්ථය ම ඇත්තේ ය.';

(ඊ) "විශේෂ නිලධරයා" යන්නෙහි අර්ථකථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

'"කර්මාන්තය" යන්නට සේවායෝජකයකු විසින් හෝ කම්කරුවකු විසින් හෝ කරගෙන යනු ලබන, ඉටු කරනු ලබන හෝ ක්‍රියාත්මක කරනු ලබන යම් කාර්මික ව්‍යාපාරයක්, වෙළෙඳ ව්‍යාපාරයක්, ව්‍යාපාරයක්, ව්‍යාපෘතියක්, වෘත්තියක් හෝ ජීව නෝපායක් සහ යම් කර්මාන්තයක යම් ශාඛාවක් හෝ යම් කාර්යයක් හෝ කාර්යාවලියක් ඇතුළත් වන්නේ ය. එහෙත් බාලාපරාධකරුවන්ට හෝ අනාථයන්ට හෝ අසරණ, ගොළු, බිහිරි හෝ අන්ද තැනැත්තන්ට කාර්මික පුහුණුවක් දීමේ කාර්යය සඳහා ප්‍රධාන වශයෙන් ම පවත්වා ගෙන යනු ලබන යම් කාර්මික ව්‍යාපාරයක්, වෙළෙඳ ව්‍යාපාරයක් හෝ ව්‍යාපාරයක් එයට ඇතුළත් නොවේ.'; තව ද

(ඊ) "ගෘහාශ්‍රිත කම්කරුවා" යන්නෙහි අර්ථකථනය වෙනුවට පහත දැක්වෙන අලුත් අර්ථකථනය ආදේශ කිරීමෙන් :—

' "ගෘහාශ්‍රිත කම්කරුවා" යන්නෙන් වේතන, කාලය අනුව හෝ කරන ලද වැඩ අනුව හෝ අන්‍ය ආකාරයකට හෝ ගණන් බලනු ලැබුව ද ඒ වේතන මත සේවානියුක්ති හෝ සේවා ගිවිසුම මේ ආඥා පනත ආරම්භ වීමට පෙර හෝ පසුව කරන ලද්දේ වුව ද එම ගිවිසුම ප්‍රකාශිතව හෝ ගම්‍යමානව, වාචිකව හෝ ලිඛිතව වුව ද යම් කර්මාන්තයක සේවයෙහි නියුක්ත කරන ලද (සාප්පුවක හෝ කාර්යාලයක වෙළෙඳ ව්‍යාපාරයේ හෝ වෙළෙඳ ව්‍යාපාරය පිළිබඳව සේවයෙහි නියුක්ත ගැහැණියක් හෝ අනියම් ස්වභාවයක සේවයෙහි නියුක්ත ගැහැණියක් නොවන) ගැහැණියක් අදහස් වේ.'.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.